# සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තුමේන්තුව

**ගණිතය - 1 ශ්‍රේණිය**

**සැකසුම - රත්නපුර අධ්‍යාපන කලාපය**

**නම - වී.ජී චන්ද්‍රලතා ගුරුතුමිය - ර /ශ්‍රී රාහුල ප්‍රාථමික විදුහල**

**3 පාඩම - ද්‍රව්‍ය කට්ටල දෙකක් එකට එක ගැළපීම.**
**පෙරවැඩ කාර්ය පත්‍රිකාව**

## පෙර සූදානම් කරගත යුතු දේවල්

කණ්ඩායම් වලට ප්‍රමාණවත් පරිදි සකසා ගන්න. නිතැතින්ම එකට එක ගැළපෙන ද්‍රව්‍ය / රූප පෝච්චි හා මල්, බැට් හා බෝල, යෝගට් කෝප්ප හා හැඳි, බෝතල් හා මූඩි, පැන්සල් හා මකන, පිඟන් හා කෝප්ප. ඉගෙනුම් ආධාරකයන් ගුරුතුමියට.

1 දූලා පුතාලා රාමුවේ සවිකර ඇති පින්තූරය දෙස හොඳින් බලන්න.

2 හැම මුහුණටම තොප්පියක් තිබේද?

3 හැම තොප්පියකටම මුහුණක් තිබේද?

4 මුහුණු ගණනටම සමානව තොප්පි තිබේද?

5 තොප්පි ගණනට සමානව මුහුණු තිබේද?



# සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තුමේන්තුව

**ගණිතය - 1 ශ්‍රේණිය**

**සැකසුම - රත්නපුර අධ්‍යාපන කලාපය**

**නම - වී.ජී චන්ද්‍රලතා ගුරුතුමිය - ර /ශ්‍රී රාහුල ප්‍රාථමික විදුහල**

## 3 පාඩම - ද්‍රව්‍ය කට්ටල දෙකක් එකට එක ගැළපීම. පැවරුම්

1 සිසු කණ්ඩායම්වල ට එකට එක ගැළපීමට හැකි ද්‍රව්‍ය කට්ටල භාජනවල ට දමා දෙන්න.

2 ඔවුන් තම මේසය මත තබා ද්‍රව්‍ය කට්ටල සසඳන ආකරය හොඳින් බලන්න.

3 එකට එක ගැළපීම සිදුකරන ආකාරය ප්‍රශ්ණ අසමින් තහවුරු කරන්න.

4 පසුව එක් ද්‍රව්‍ය කට්ටලයක ද්‍රව්‍ය එකක් අඩුකර ගැළපීමට සිසුන් යොමු කරන්න ප්‍රශ්ණ අසන්න.

5 නැවත එම ද්‍රව්‍ය කට්ටලයෙම ද්‍රව්‍ය දෙකක් වැඩිකර ගැළපීමට යොමු කරන්න. ප්‍රශ්ණ අසන්න.

6 මෙලෙස අඩුයි/වැඩියි, සමානයි සංකල්පය තහවුරු කරන්න.



දූලා පුතාලා මේ ක්‍රියාකාරකම් කර ඔබේ ගුරුතුමියගෙන් රන් තරුවක් ඉල්ලා ගන්න.

1 එකට එක යා කරන්න.



2 යෝගට් කෝප්පයට හැන්දක් අඳින්න.



3 අඩුවෙන් ඇත්තේ මොනවාද? වැඩියෙන් ඇත්තේ මොනවාද? වැඩි ගොඩ රවුම් කරන්න. අඩු ගොඩ පාට කරන්න.



# සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තුමේන්තුව

ගණිතය - 1 ශ්‍රේණිය

සැකසුම - රත්නපුර අධ්‍යාපන කලාපය

නම - වී.ජී චන්ද්‍රලතා ගුරුතුමිය - ර /ශ්‍රී රාහුල ප්‍රාථමික විදුහල

3 පාඩම - ද්‍රව්‍ය කට්ටල දෙකක් එකට එක ගැළපීම
පසුවැඩ කාර්ය පත්‍රිකාව.

1 ඔබේ පන්තියේ A,B,C,D,E කණ්ඩායම් දෙස බලන්න.

2 එම කණ්ඩායම් වල වැඩියෙන්, අඩුවෙන්, සමානව සිටින ගැහැණු හා පිරිමි ළමුන් කණ්ඩායම් තෝරන්න.

3 පිරිමි ළමුන් වැඩියෙන් සිටින කණ්ඩායම් මොනවාද?

4 ගැහැණු ළමුන් වැඩියෙන් සිටින කණ්ඩායම් මොනවාද?

5 ගැහැණු ළමුන් හා පිරිමි ළමුන් සමානව සිටින කණ්ඩායම් මොනවාද?